සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II |

සැලකිය යුතුයි:
(i) පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
(ii) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01) (i) බුදුරජාණන් වහන්සේගේ තාදී ගුණය ප්‍රකට වන අවස්ථා දෙකක් ලියන්න.

(ii) පංච ශීලයේ දැක්වෙන ජීවිතාරක්ෂාව හා දේපල ආරක්ෂාව තහවුරුවන සිල්පද දෙක ලියන්න.

(iii) මහා සංඝරත්නය විසින් සිදුකරන ආගමික හා සාමාජික සේවාවන් එක බැගින් ලියන්න.

(iv) තෙරුවන් ගුණ විසිහතරක් වන ආකාරය ලියා දක්වන්න.

(v) කුසල මූල දෙකක් ලියන්න.

(vi) බුදුරජාණන් වහන්සේ ''අරහං'' යනුවෙන් හැඳින්වීමට හේතුවන ගුණ දෙකක් ලියන්න.

(vii) යහපත් රාජ්‍ය පාලනයක් සඳහා බුදුරජාණන් වහන්සේ අනුදැන වදාල රාජ්‍ය පාලන ප්‍රතිපත්ති දෙකක් ලියන්න.

(viii) පරෙවි සංදේශය හා බුදුගුණඅලංකාරය යන කෘතීන් දෙක රචනා කළ කතුවරුන් දෙදෙනා නම් කරන්න.

(ix) දාගැබක දක්නට ලැබෙන අංග දෙකක් නම් කරන්න.

(x) ධ්‍යාන මුද්‍රාව සහ අභය මුද්‍රාව දක්වෙන ප්‍රතිමා දෙකක් නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) (1) වෙනත් කිසිදු උපතක දක්නට නොලැබෙන බෝසත් උපතේ පමණක් දක්නට ලැබෙන අසිරිමත් සිදුවීම් දෙකක් ලියන්න.

(2) සිදුහත් කුමරුගේ ළමා අවධියේ දක්නට ලැබුණු සුවිශේෂ ලක්ෂණ තුනක් ලියන්න.

(3) කැපවීම, අධිෂ්ඨානය හා නිවැරදි දේ තෝරා ගැනීම තුළින් ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 2+3+5=10)

(03) (1) අකුසල මූල දෙකක් ලියන්න.

(2) කර්මයේ බලපෑම අනුව වර්තමාන කර්ම වලින් හා පරිසර සාධක මගින්, අතීත කර්මයන් වෙනස් කළ හැකි අවස්ථා හතරකි. ඉන් තුනක් ලියන්න.

(3) ඔබගේ ජීවිතය යහපත්ව පවත්වා ගෙන යන්නේ නම් එහි විපාක මෙලොව දීම අත්විඳිය හැකිය. පරලොව සුගතියටද හේතුවේ. සාකච්ඡා කරන්න. (ලකුණු 2+3+5=10)

(04) (1) '' බෞද්ධයාගේ අත්පොත හෙවත් ධම්මපදය" අයත්වන්නේ ත්‍රිපිටකයේ කවර පිටකයට ද? කවර නිකාය ග්‍රන්ථයට ද?

(2) ''............................................... අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති" මෙම ගාථාවේ ඉහත පද තුන සම්පූර්ණකර ලියන්න.

(3) පාසල් ළමුන් වන ඔබට ඔබේ ජීවිතය යහපත් මාවතකට යොමු කර ගැනීමට මෙම ගාථාවෙන් දෙන උපදෙස් ප්‍රයෝජනවත් වන අයුරු විස්තර කරන්න. (ලකුණු 2+3+5= 10)

(05) සම්බුද්ධ ශාසනයේ සුරක්ෂිතතාව හා අභිවෘධිය වෙනුවෙන් මහතෙරවරු එක්ව බුද්ධ වචනය ඒකරාශී කොට සජ්ඣායනා කිරීම ධර්ම සංගායනා නම් වේ.

(1) පළමු ධර්ම සංගායනාව සඳහා භාවිතා කරන වෙනත් නමක් ලියන්න.

(2) එම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, දායකත්වය හා මූලිකත්වය දැරුවේ කවුරුන්දැයි නම් කරන්න.

(3) පාසලක් තුළ ඇතිවන ඕනෑම ගැටලුවක් සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 2+3+5=10)

(06) බෝසත් චරිතය හා සම්බන්ධ වැදගත් සිදුවීම් බොහෝමයකට පසුබිම වී ඇත්තේ නිසල සොඳුරු පරිසරයයි.

(1) එවැනි අවස්ථා දෙකක් ලියන්න.

(2) පමණ දැන ආහාර ගැනීමෙන් කායික නීරෝගීතාව ආරක්ෂා වේ. භද්දාලි සූත්‍රයේ සඳහන් පමණ දැන ආහාර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.

(3) සුරක්ෂිත පරිසරයක් ගොඩනගා ගැනීමට ඔබට කළහැකි කාර්යයන් මොනවාදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 2+3+5=10)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(1) අනගාරික ධර්මපාල තුමා

(2) බුද්ධානුස්සති භාවනාව

(3) කෝට්ටේ සාහිත්‍ය යුගය

(4) සප්ත අපරිහානීය ධර්ම (ලකුණු 5 +5 = 10)